## අකුසල විපාක සිත් -

මේවා අකුසල ලෙස හඳුන්වන්නේ සිත් වශයෙන් අකුසල නිසා නොව පෙර අකුසලයකට විපාක ලෙස ලැබුණ හෙයිනි. සොරකුගේ පුතා සොරෙක් නොවුවත් “සොරාගේ පුතා” යැයි කියන්නා සේය. ඔහුට සැමවිටම ලැබෙන්නේද නින්දාවෝමය. එසේම මෙම අකුසල විපාක සිත්වලටද සැමවිටම අනිෂ්ඨ අරමුණක්ම හමුවෙති. දුක්දෙන අරමුණු ඇසට හමුවී උ. චක්ඛු විඤ්ඤානය පහලවෙයි. ඒ දුක් අරමුණු හමුවන්නේ පෙර අකුසලයක විපාකය ලෙසයි.

- කාය විඤ්ඤාණය උපේක්ෂා නොවූයේ ඇයි ? හමුවන අරමුනෙහි ස්වභාව ලක්ෂණය අනුවයි. ඇස ආදියට සියුම් අරමුණු හමුවුවද කයට හමුවන්නේ පඨවි ආදී කර්කෂ අරමුණුය.

## අහේතුක කුසල විපාක සිත්-

- ඉෂ්ඨ (කුසල) අරමුණක් සඳහා විපාක වශයෙන් ලැබෙන සිත්ය. අරමුණ ඉෂ්ඨ නිසා කායද්වාරයට විපාක ලෙස හමුවන අරමුණුද ඉෂඨ (කුසල) අරමුණුමය. එසේම පඨවි ආදී කර්කෂයෝය. එනිසාම සිත සුඛ සහගත ලෙස දක්වයි. සංතීරනයද ඇතැම්විට සෝමනස්ස ද වෙයි.

## අහේතුක ක්‍රියා සිත් -

- කර්මත් නොවන්නේ විපාකත් නොවන්නේ ක්‍රියා සිත්ය. අහේතුක ක්‍රියාසිත් 3කි. (ඉහත දක්වන ලදී) එයින් 1 සහ 2 සැමට ඇතිවන අතර 3 හසිත සිත ඇතිවන්නේ රහත් උතුමන්ටය. ක්‍රියා සිත් වර්ග 2කි එනම් අහේතුක සහ සහේතුක වශයෙනි. මෙහි අහේතුක සිත් ගැන විස්තර කර ඇත.
- හසිතුප්පාද සිතෙන් සිනහ උපදවයි. ඒ රහත් උතුමන්ටය. පෘතග්ජනයෝ සිනහ වන්නේ කාමාවචර කුසල සහ අකුසල සිත් වලිනි.

**සිනහව-** සිනහ වර්ග 6කි.

- සිත - ඇස්දෙක පමණක් විවෘත වේ.---- බුදු පසේබුදු රහත් උතුමන් * රහත් උතුමෝ සිත් 5කින් සිනහවෙත්- අ.හසිත 1/කා.ක්‍රියා 4
- හසිත - දත්වල අගපෙනෙන සිනහව------ බුදු පසේබුදු රහත් උතුමන්
- විහසිත - මිහිරි හඬක් ඇසෙන සිනහව----- කල්‍යාණ පෘතග්ජන/ සේඛ උතුමන් * සේඛ උතුමන් සිත් 6කින් සිනහවෙත්-අ.දි.වි.2/කුසල සො. 4
- උපහසිත - උරහිස් සැලෙන සිනහව---------- කල්‍යාණ පෘතග්ජන/ සේඛ උතුමන්
- අපහසිත - ඇස්වලින් කඳුළු ගලන සිනහව--- ලාමක අදහස් ඇත්තන්ගේ සිනහව * පෘතග්ජනයො සිත් 8කින් සිනහවෙත්-සෝ.කු 4/සෝ.අකු.4
- අතිහසිත - මුළු සිරුරම සෙලවෙන සිනහව--- ලාමක අදහස් ඇත්තන්ගේ සිනහව *** හසිතුප්පාද සිතෙන් සිත සහ හසිත පමණක් සිදුකරයි.